## Pathmini Kanthilatha– Galle



Mrs. Pathmani is living in Koggalakade in Galle District. She was working at a garment factory and earned Rs.7,000 monthly as the salary. Her husband was a farmer and he was earning Rs. 15,000 per month from his cultivation. They are having 2 children. After working 2 years in garment factory, Pathmini resigned from her job and started her own home-based dress making business. She started her business with a normal sewing machine bought for Rs. 6,000.

Pathmaini joined CBLMF in 2012 with a fellow women group. She obtained a startup LDL of Rs 20,000 loan & bought a new sewing machine to increased the production capacity. She is a clever micro entrepreneur who developed the business rapidly. Due the limited space in her house, she shifted to a rented building to enhance the production. Padmini paid here loan on time and became “A” graded client of CBLMF.

She was participated in Business Plan training program conducted by CBLMF in 2013 and based on her business plan, CBLMF granted a loan of Rs. 50, 000 to purchase a high speed Juki Sewing machine & raw materials. Within 3yers, Pathmini developed here business with a increased production capacity with 3 machines. Now she is having diversified business with tailoring of school uniforms for approximately 100 students in the area.

After successful repayment of the loan, Pathmini was participated another CBLMF Business Plan training program in 2014 and obtained a microenterprises loan of Rs. 70,000. She bought another high speed Juki machine to increase the production capacity further and during the last 3 years she has been an active member in CBLMF and obtained CBLMF business services and other credit facilities.

Currently Pathmini has more than Rs 550,000 business assets and earns a monthly net profit of Rs. 30,000. Business relationship with CBLM, she was able to gather very good business management knowledge and acquired valuable assets and won reputations from her colleagues.

She is thinking of starting up a small garment factory in view of providing employment opportunities for the “ 2015 fellow women's” in her village. She is also an active member of CBLM member welfare scheme.



පද්මිනි කාන්තිලතා මහත්මිය ගාල්ල කොග්ගල කඩේ ප්‍රදේශයේ ජිවත්වන දෙදරු මවකි .ඇය ගාල්ල ඇඟලුම් කම්හලක සේවය කර මසකට රු 7,000 වැටුපක් ලබාගන්නා ලද අතර ස්වාමිපුරුෂයා කෘෂිකාර්මික කටයුතුවල නියැලීමෙන් මසකට රු 15,000 ක් පමණ උපයාගන්නා ලදි . දරුවන් දෙදෙනෙකුගේ මවක වන ඇය වර්ෂ 2 ට ආසන්න සේවා කාලයකින් පසු එතෙක් රැකියාව කරමින් සිටි ඇඟලුම් කම්හලෙන් ඉවත් වී රු.6,000ක් ආයෝජනය කර සාමන්‍ය මැෂිමක් මිලදීගෙන ඇදුම් මැසිමේ ව්‍යාපාරයක් නිවසේම ආරම්භ කරන ලද අතර නිවසේ එදිනෙදා කටයුතු සමග සුළු වශයෙන් ඇදුම් මැසීම කරගෙන යන ලදී.

2012 වර්ෂයේදි පද්මිනි කොග්ගල කඩේ සී බී ලංකා කාන්තා කණ්ඩායමට සම්බන්ධ වි රු.20,000 ක ණය මුදලක් අංක **GL/04520**යටතේ ලබාගෙන සිංගර් සිග්සැග් මැෂිමක් මිලදීගත් අතර ඉතා දක්ෂ සුළු ව්‍යවසායිකාවක වූ ඇය ක්‍රමානුකූලව තම ව්‍යාපාරය වැඩිදියුණු කරගන්නා ලදි. ඇගේ නිවසේ ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවු හෙයින් ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබාගත් අතර ආයතනයෙන් ලබාගත් ණය වාරික නිසිපරිදි ගෙවීම නිසා ඒ ශ්‍රේණියේ ගණුදෙනුකරුවකු ලෙස වර්ග කරනු ලැබිණි.

පසුව 2013 වර්ෂයේදී පද්මිණි, ආයතනය මගින් සංවිධානය කල ව්‍යාපාර උපදේශන සේවා හා ව්‍යාපාර සැලසුම් සැකසීමේ වැඩමුළුවට සහභාගී වී ලබාගත් දැනුමින් නිවැරදි ව්‍යාපාර සැලැස්මක් සකසා රු 50,000 ණය මුදලක් **GL/04800** යටතේ ලබාගන්නා ලදි. එම ණය මුදල ව්‍යාපාරයට අවශ්‍ය ජුකී මැෂිමක් මිලදි ගැනීමටත් කාරක ප්‍රාග්ධනය වැඩිකර ගැනීමටත් යොදාගන්නා ලද අතර වසර තුනක කාලයක් තුල මැෂින් තුනක් සමග ව්‍යාපාරයේ මෙහෙයුම් ධාරිතාව වැඩිදියුණු කර ගැනීමට ඇයට හැකිවිය. වර්තමානය වන විට පාසල් නිල ඇඳුම් මැසීම කෙරෙහි ද යොමු වී ඇති ඇය ප්‍රදේශයේ සිසුන් 100කට පමණ සිය සේවාව ලබාදෙමින් සිටින්නීය.

2014 වර්ෂයේදි පද්මණි, සී බී ලංකා ආයතනය පැවත් වු තවත් ව්‍යාපාර සැලසුම් කිරීමේ වැඩමුළුවකට සහභාගි වී තවදුරටත් ව්‍යාපාර කළමනාකරණ දැනුම දියුණු කර ගනිමින් ඇයගේ ව්‍යාපාරය වැඩිදියුණු කිරිම සඳහා සැලසුමක් සකස්කරන ලද අතර **GL/05217**යටතේ රු 70,000 ණයමුදලක් ලබාගන්නා ලදි. ඇය එම ණය මුදල වඩා කාර්යක්ෂම ජුකි මැෂිමක් හා ඕවර්ලොක් මැෂිමක් මිලදි ගැනිමට හා කාරක ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කල අතර ව්‍යාපාරයේ හදිසි මුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා  ක්ෂණික ණය අවස්ථා 10 ට ආසන්න ප්‍රමාණයකදී ලබාගෙන ඇති, සී බී ලංකා ආයතනයේ විශ්වාසනීය ගනුදෙනු කරුවකු බවට පත්වී ඇත.

වර්තමානය වන විට පද්මිණී මහත්මියගේ ව්‍යාපාරය සතුව රු.550,000/-කට අධික ව්‍යාපාරික වත්කම් ප්‍රමාණයක් ඇති අතර ඇය විසින් මාසික ශුද්ධ ආදායම වශයෙන් රු.30,000/-ක් පමණ උපයන්නීය. සී බී ලංකා ආයතනය හා පැවති ව්‍යාපාරික සබඳතාවය නිසා ඇයට ඉතා හොඳ ව්‍යාපාර කළමණාකරණ දැනුමක්, වටිනා වත්කම් හා සිය සගයන් අතර ප්‍රමුඛතාවයක් දිනා ගැනීමට හැකියාව ලැබී ඇත.

මේ වන විට ඇගේ අරමුණ වී ඇත්තේ කුඩා පරිමාණයේ ඇඟළුම් කම්හලක් ආරම්භ කර ඇගේ ප්‍රදේශයේ ජීවත් වන සෙසු කාන්තා කණ්ඩායම් වෙත රැකියා අවස්ථා ලබා දීමට වන අතර ඇය සී බී ලංකා ආයතනයේ සාමාජිකත්ව සුභසාධන අරමුදලෙහිද ක්‍රියාකාරී සාමාජිකාවකි.